# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2299/38 - 2022 සැප්තැම්බර් 28 වැනි බදාදා - 2022.09.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## හිමිකම් ලියාපදිංචි කිරීම

**1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත**

14 වැනි වගන්තිය යටතේ හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්ගේ තීරණ ප්‍රකාශය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 554බී - කොරලවැල්ල නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කොරලවැල්ල නමැති ගමේ පිහිටියා වූ ද, අංක 520215 දරන කැඩැස්තර සිතියමේ කලාප අංක 13 හි කැබලි අංක 25 දරන ඉඩම් කොටස ලෙස පෙන්නුම් කොට ඇත්තා වූ ද, හිමිකම් පෑම් ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙමින් 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 12 වැනි වගන්තිය ප්‍රකාර 2011.04.05 වැනි දින අංක 1700/07 දරන *ගැසට් පත්‍රයේ* යථා පරිදි පළකරන ලද අංක 52/0448 දරන දැන්වීමේ සඳහන් කොට ඇත්තා වූ ද, ඉඩම් කොටස්වල අයිතිය සම්බන්ධයෙන් මෙහි උපලේඛනයේ දැක්වෙන මාගේ තීරණ 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 14 වැනි වගන්තියෙන් පහත අත්සන් කරන මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර, මම මෙයින් ප්‍රකාශ කරමි.

**පී.එම්.එච්. ප්‍රියදර්ශනී,**
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්.

2022 ජූලි මස 27 වැනි දින,
බත්තරමුල්ල,
රජමල්වත්ත පාර,
"මිහිකත මැදුර", අංක 1200/6,
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ දී ය.


1A - G 37662 - 09 (2022/09)

*සැ.යු.- මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

| *ඉඩම් කොටසේ අංකය* | *විශාලත්වය* | *අයිතිකරුගේ/අයිතිකරුවන්ගේ සම්පූර්ණ නම/නම් සහ ලිපිනය* | *ජාතික හැඳුනුම්පත් අංකය* | *අයිති ඉඩමේ ප්‍රමාණය* | *අයිතියේ පන්තිය සහ ස්වභාවය* | *විනිශ්චයන් සහ ඉන්ජෙන්ෂන් තහනම් අපේක්ෂාවෙන් ඇති උකස් සහ බැඳීම් පිළිබඳ විස්තර* | *යම් විශේෂ හෝ පෞද්ගලික නීතියකට යටත් නම් ඒ පිළිබඳ විස්තර* |
|---|---|---|---|---|---|---|---|
| | *(හෙක්ටයාර්)* | | | | | | |
| 25 | 0.0089 | පුද්ගලික | – | සම්පූර්ණ | ප්‍රථම පන්තිය | – | කැබලි අංක 26 සහ 27 ට ප්‍රවේශ වීම සඳහා |

EOG 9-0349

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.